*සැ. යු.* - 2010.10.28 වැනි දින පළවූ අංක 1,691 දරන *ගැසට් පත්‍රයේ* II සහ IV (අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,692 - 2011 පෙබරවාරි මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2011.02.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 66 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 68 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 71 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 පෙබරවාරි මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජනවාරි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

65- B 080194—3,350 (2011/02)
A1–

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2011 අංක 30

DRF/21/RECT/3184.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2010 දෙසැම්බර් මස 31 වැනි දින සිට ලුතිතන් කර්නල් (උපකරණ පාලක) නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත ඃ

තාවකාලික ලුතිතන් කර්නල් (උපකරණ පාලක) හර්ෂ ප්‍රියන්ත නිමල් ආරියරත්න, යූඑස්පී - ශ්‍රීලයුවෙබ (නි/61312).

**විශ්‍රාම ගැනීම**

පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2011 ජනවාරි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත ඃ

ලුතිතන් කර්නල් (උපකරණ පාලක) හර්ෂ ප්‍රියන්ත නිමල් ආරියරත්න, යූඑස්පී - ශ්‍රීලයුවෙබ (නි/61312).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

02-122

---

DRF/21/RECT/2901.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල පහත හෙළීමක් සහ විශ්‍රාම ගැන්වීමක්

**නිල පහත හෙළීමක්**

පහත නම සඳහන් නිලධාරී 2009 අගෝස්තු මස 04 වැනි දින සිට මේජර් නිලයට නිල පහත හෙළීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත ඃ

මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) දොන් තෝමස් ඇල්බට් විජේතුංග තිලකරත්න, පීඑස්සී - ගැහේබ (නි/60542).

**විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් නිලධාරී 2009 අගෝස්තු මස 05 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත ඃ

මේජර් දොන් තෝමස් ඇල්බට් විජේතුංග තිලකරත්න, පීඑස්සී - ගැහේබ (නි/60542).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

02-115

---

2011 අංක 31

DRF/21/RECT/2897.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2009 ඔක්තෝබර් මස 25 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත ඃ

මේජර් වත්තේගේ තැන්නේ වත්තේගෙදර අබයවර්දන, ශ්‍රීලවියාඉ (නි/61896).

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2009 ඔක්තෝබර් මස 25 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත ඃ

මේජර් වත්තේගේ තැන්නේ වත්තේගෙදර අබයවර්දන, ශ්‍රීලවියාඉ (නි/61896).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

02-123

2011 අංක 32

DRF/21/RECT/2896.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2009 ජූලි මස 30 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

තාවකාලික මේජර් සෙනෙවිරත්න ගෝමර මුදියන්සේලාගේ ධම්මික ගුණසේකර, ශ්‍රීලයුසේබ (නි/61037).

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධරී 2009 ජූලි මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් සෙනෙවිරත්න ගෝමර මුදියන්සේලාගේ ධම්මික ගුණසේකර, ශ්‍රීලයුසේබ (නි/61037).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

02-116

---

2011 අංක 33

DRF/21/RECT/2939.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරී 2009 ජූලි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් ඇලබඩගේ සුගත් සේනාරත්න, ශ්‍රීලපාහ (නි/63544).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

02-120

---

DRF/21/RECT/3192.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2010 සැප්තැම්බර් මස 09 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිතන් හෙන්දා තන්ත්‍රි දයාන් දේශායි, ගැහේබ (නි/65391).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

02-118

---

DRF/21/RECT/3188.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2010 සැප්තැම්බර් මස 09 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිතන් අයිත් අච්චිගේ සංජය ඉන්ද්‍රජිත් අයිත්අච්චි, ආර්ඩබ්පී - ශ්‍රීලංසිරෙ (නි/62256).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

02-121

DRF/21/RECT/3187.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2010 ජූලි මස 06 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

දෙවන ලුතිතන් මොහාන් මධුරංග ත්‍රිකාවල, ශ්‍රීලකාහ (නි/65809)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

02-119

# රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (8) (අ) වගන්තිය යටතේ නියමය**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(8)(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් "හැඩිගල්ල ශ්‍රී රත්නාරාම විහාරයේ ගොඩනැගිලි අරමුදල" එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2011 ජනවාරි මස 17 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

උපලේඛනය

"හැඩිගල්ල ශ්‍රී රත්නාරාම විහාරයේ ගොඩනැගිලි අරමුදල"

02- 75

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (8) (අ) වගන්තිය යටතේ නියමය**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(8)(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් "දෙහිවල නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ විහාර සංවර්ධන අරමුදල" එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2011 ජනවාරි මස 17 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

උපලේඛනය

"දෙහිවල නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ විහාර සංවර්ධන අරමුදල"

02- 76

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (8) (අ) වගන්තිය යටතේ නියමය**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(8)(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් "පන්නත්ගොඩ පුරාණ රජමහා විහාරය ප්‍රතිසංස්කරණය සඳහා වූ අරමුදල" එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2011 ජනවාරි මස 17 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

උපලේඛනය

"පන්නත්ගොඩ පුරාණ රජමහා විහාරය ප්‍රතිසංස්කරණය සඳහා වූ අරමුදල"

02- 77

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (8) (අ) වගන්තිය යටතේ නියමය**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(8)(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් "පොළොන්නරුව සෝමාවතී රජමහ විහාරස්ථ සංවර්ධන අරමුදල" එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2011 ජනවාරි මස 17 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

උපලේඛනය

"පොළොන්නරුව සෝමාවතී රජමහ විහාරස්ථ සංවර්ධන අරමුදල"

02- 78

### 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (8) (අ) වගන්තිය යටතේ නියමය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(8)(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් "ගැටබරු සහන සේවා පදනම" එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2011 ජනවාරි මස 17 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01

උපලේඛනය

"ගැටබරු සහන සේවා පදනම"

02- 79

---

### කන්න රැස්වීම - 2010/2011 - මහ කන්නය

අබේවෙල ව්‍යාපාරය

1994 අංක 13 දරන වාරිමාර්ග (සංශෝධන) ආඥාපනතේ පරිදි 2010.11.11 වැනි දින පස්වරු 3.00ට අබේවෙල වාරිමාර්ග ඒකක කාර්යාලයේ රැස්වීම් ශාලාවේ දී මහ කන්නය සඳහා කන්න රැස්වීම පැවැත් වූ අතර, එහිදී ගන්නා ලද තීරණ පහත සඳහන් කරමි.

| | | | වී අක්කර | එළවළු අක්කර | | |
|---|---|---|---|---|---|---|
| 1. | වගා කරන බිම් ප්‍රමාණය | | 158 | 925 | - | 1083 |
| 2. | වගා කරන බෝගය- | | | | | |
| | තවාන | - | | 80 | | |
| | වැලි බිස්සවෙල | - | 13 | 250 | | |
| | අඹගස්දෝව | - | 15 | 160 | | |
| | හිඹිලියගොල්ල | - | 65 | 300 | | |
| | තෙන්නකෝන්වෙල | - | 65 | 135 | | |
| 3. | ඇළ වේලි ශුද්ධ කර අවසන් කරන දිනය | | | | - | 2010.11.20ට පෙර |
| 4. | පළමු ජල මුරය නිකුත් කරන දිනය | | | | - | 2010.12.12 |
| 5. | බිම් සකස් කිරීම | | | | - | 2011.01.15ට පෙර |
| 6. | බෝග සිටුවා අවසන් කිරීම | | | | - | 2011.01.25ට පෙර |
| 7. | අවසන් ජල මුරය | | | | - | 2011.04.30 (2011.04.12 සිට 2011.04.20 දක්වා ජලය නතර කිරීම) |
| 8. | ඇළවේලි ශුද්ධ නොකරන අයට දඩය | | | | - | මීටර් 10ට රු. 600 |
| 9. | දෙවන වර ඇළ වේලි ශුද්ධ කිරීම | | | | - | 2011 මාර්තු දෙවැනි සතියට පෙර |
| 10. | අස්වනු නෙලා අවසන් කිරීම | | | | - | 2011.05.15 |

11. අවශ්‍යතාවය අනුව ජල හිඟ වූ විට මුර ක්‍රමය ක්‍රියාත්මක වේ
12. අනවසර වක්කඩ ඉවත් කිරීමට ද තීරණය විය.
13. ජලය නිකුත් කිරීමට පෙර අමුණ අසල දේව දානයක් දීමට තීරණය විය.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2011 ජනවාරි මස 10 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-05

---

### 2010/2011 මහ කන්නය - මහඑළිය ව්‍යාපාරයේ කන්න රැස්වීම් වාර්තාව

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහඑළිය ව්‍යාපාරයේ 2010/2011 මහකන්නය සඳහා කන්න රැස්වීම 2010.11.25 වැනි දින පිටපොල ප්‍රජා ශාලාවේ දී පවත්වන ලදී. එහි දී පහත තීරණ ගන්නා ලදී :

| | | | |
|---|---|---|---|
| 01. | වගා කරන බිම් ප්‍රමාණය | - | අක්කර 540 (රජයේ ගොවිපල හා පර්යේෂණ ආයතනයේ ගොවිපල අක්කර 120 පමණ) |
| 02. | වගාකරණය | - | වී |
| 03. | ඇලපේලි ශුද්ධකර අවසන් කරන දිනය | - | 2010.12.10ට පෙර |
| 04. | පළමු ජල මුරය නිකුත් කරන දිනය | - | 2010.11.18 |
| 05. | බිම් සකස් කිරීම | - | 2010.01.15ට පෙර |
| 06. | තවාන් දැමීම- | | |
| | පුරංවෙල දියලඅරාව | - | 2010.12.10ට පෙර |
| | පිටපොල අනෙකුත් කොටස් | - | 2010.12.20ට පෙර |
| | හින්නාරංගොල්ල | - | 2010.12.20ට පෙර |
| 07. | පැල සිටුවා අවසන් කිරීම | - | 2011.01.20ට පෙර |
| 08. | අවසන් ජල මුරය | - | 2011.05.20ට පෙර |
| 09. | ඇළවේලි ශුද්ධ නොකරන අයට දඩය | - | වී පැලකට රු. 500 |
| 10. | අස්වනු නෙලා අවසන් කිරීම | - | 2011.06.15ට පෙර |
| 11. | අවශ්‍යතාවය අනුව හිඟවූ විට මුර ක්‍රමය ක්‍රියාත්මක වේ | | |
| 12. | ප්‍රධාන ඇල දෙවන වර ශුද්ධ කිරීම | - | 2011.03.15-25 අතර කාලය |
| 13. | කන්න රැස්වීම තීරණය අදාළ කුඹුර ඉඩම් උකස් හා බදු මත ගොවිතැන් කරන ගොවීන්ට ද දැනුවත් කිරීමට තීරණය විය. | | |

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2011 ජනවාරි මස 10 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-04

## කන්න රැස්වීම - 2010/2011 මහ කන්නය

කන්දේ ඇල ව්‍යාපාරය

1994 අංක 13 දරන වාරිමාර්ග (සංශෝධන) ආඥාපනතේ පරිදි 2010.10.21 වැනි දින පෙ. ව. 2.30ට කන්දේ ඇල වාරිමාර්ග ඒකක කාර්යාලයේ රැස්වීම් ශාලාවේ දී මහ කන්නය සඳහා කන්න රැස්වීම පැවැත්වූ අතර එහි දී ගන්නා ලද තීරණ පහත සඳහන් කරමි.

| | | | | |
|---|---|---|---|---|
| 01. | වගා කරන බිම් ප්‍රමාණය | - | අක්කර 2,300 | |
| 02. | වගා කරන බෝගය | - | පුරන්වෙල | - වී |
| | | | ගවරම්මාන | - වී |
| | | | අලුත් ඇල | - වී/එළවලු |
| | | | දිවුරුම්වෙල | - වී/එළවලු |
| | | | කොහිලගොල්ල | - වී |
| | | | නුගතලාව | - වී |
| | | | වැවදිගදෝව | - වී |
| 03. | ඇළවේලි ශුද්ධකර අවසන් කරන දිනය | - | 2010.11.25ට පෙර | |
| 04. | පළමු ජල මුරය නිකුත් කරන දිනය | - | 2010.12.01 | |
| 05. | බිම් සකස් කිරීම | - | 2010.12.12ට සිට 2010.12.30 දක්වා | |
| 06. | බෝග සිටුවා අවසන් කිරීම | - | 2011.01.10 | |
| 07. | අවසන් ජල මුරය | - | 2011.05.15 | |
| 08. | ඇළවේලි ශුද්ධ නොකරන අයට දඩය | - | රු. 500 දිනකට | |
| 09. | දෙවන වර ඇළවේලි ශුද්ධ කිරීම | - | 2011.03.15 සිට 25 දක්වා | |
| 10. | අස්වනු නෙලා අවසන් කිරීම | - | 2011.05.30 | |
| 11. | අවශ්‍යතාවය අනුව ජල හිඟ වූ විට මුර ක්‍රමය ක්‍රියාත්මක වේ. | | | |

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2011 ජනවාරි මස 10 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-06

---

## ජාතික ළමා ආරක්ෂක අරමුදල පිහිටුවීම, එහි කර්තව්‍ය හා පරිපාලනය

මෙය ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ "ජාතික ළමා ආරක්ෂක අරමුදල" නමින් හැඳින්වේ. මෙය අතිශයින්ම ලාබ නොලබන රාජ්‍ය ළමා ආරක්ෂණය සඳහා වූ අරමුදලයි. ජාතික ළමා ආරක්ෂක අරමුදල සඳහා වලංගුවන පාර්ලිමේන්තු පනත වන්නේ 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පනතයි.

**02. අදාළ පනතේ පසුබිම**

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත මගින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා ඇත. එය මේ දක්වා ක්‍රියාත්මක වීමේ දී පනතේ 20 වැනි වගන්තියට අනුව "අරමුදල" යන්න නමින් දැක්වෙන අරමුදලක් අධිකාරියට ස්ථාපිතව තිබිය යුතුව තිබිණි. නමුත් එම ප්‍රතිපාදනය කිසියම් ප්‍රමාද හේතුන් නිසා ස්ථාපිත නොවූවත් 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ 20 වැනි වගන්තියේ අධිකාරියේ ස්වකීය බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී අධිකාරියේ අරමුදලින් සිදුවිය යුතු ක්‍රියාකාරීත්වය හා වගකීම පැහැදිලි කර ඇත.

**03. 1998 අංක 50 දරන පනතේ කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කිරීමට අරමුදල් ලබා ගැනීම හා යොදා ගැනීම**

1998 අංක 50 දරන පනතේ 14 වැනි වගන්තියේ දැක්වෙන අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම හා ඒ සඳහා වූ පනතේ 15 වැනි වගන්තියේ අධිකාරියට අයත්වන බලතල යටතේ ක්‍රියාත්මක කිරීම පැහැදිලි කොට ඇත. සුවිශේෂීව කර්තව්‍ය යටතේ ළමා අපචාර වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපචාරවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ අයිතීන් රැකගැනීම කළ යුතු බව සඳහන්ව ඇත. දරුවන්ගේ රැකවරණය වෙනුවෙන් අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රතිපාදන සලසා ඇත. පනතේ පරිදි වන කර්තව්‍ය හා බලතල මගින් ජාතික ළමා ආරක්ෂක අරමුදල යටතේ ද සිදුවන ක්‍රියාකාරිත්වය ශක්තිමත්ව සවිබල ගන්වා ඇත.

**04. අරමුදලට ලැබෙන මූල්‍ය පරිත්‍යාග සඳහා වූ බදු නිදහස්වීම**

1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වැනි වගන්තිය ප්‍රකාරව අධිකාරිය වෙත මුදලින් හෝ අන්‍යාකාරයෙන් කෙරෙන සෑම පරිත්‍යාගයක්ම ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට මුදලින් හෝ අන්‍යාකාරයකින් කරන ලද පරිත්‍යාග ලෙස සලකා "ඇතැම් බදුවලින් නිදහස් කිරීම" යන්න පනතේ 21 වැනි වගන්තියෙන් පැහැදිලිව දක්වා තිබීමෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පරිත්‍යාග සඳහා වන බදු නිදහස් ප්‍රමාණයන් පරිත්‍යාගශීලීන් වෙත ලබා දේ. (මෙය 2007 සංශෝධිත දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුව වරින් වර රජය ලබා දෙන නියෝග අදාල කරගනු ලැබේ). ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබෙන සෑම මූල්‍ය පරිත්‍යාගයක්ම මෙම අරමුදලට බැර කෙරේ. ඒ සඳහා රජයේ මුදල් ලැබීම් වාර්තා පොත් මගින් ලදුපත් නිකුත් කෙරේ. ඒවා සියල්ලම විධිමත්ව ලේඛනගත කෙරේ. ඒ මත පදනම්ව බදු නිදහස් සහතික ලබා දීමට නිර්දේශ කෙරේ.

**05. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී ලබා දී ඇති නිර්දේශය**

අතිගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් පැවති ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී මේ දක්වා අරමුදල ස්ථාපිත වී නොතිබීම සභාපතිතුමිය අවධාරණය කිරීමෙන් අනතුරුව ජනාධිපති ලේකම්තුමා විසින් මේ සඳහා පවතින පනත පරිදි ක්‍රියාත්මකවීම අත්‍යාවශ්‍ය බව අවධාරණය කර ඇත.

**06. මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය**

මුදල් අමාත්‍යාංශයෙන් ද ජාතික ළමා ආරක්ෂක අරමුදල පිහිටුවීමට අවසර ලබා දී ඇත. එය මුදල් අමාත්‍යාංශය 2010.11.16 වැනි දින පවතින 1998 අංක 50 පනත මත පිහිටුවන ලෙසට අනුමැතිය ලබා දී ඇත.

**07. මහින්ද චින්තන ඉදිරි දැක්ම**

මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළ අතිගරු ජනාධිපතිතුමා "මල් වන් දරුවන් " යන හැඳින්වීම යටතේ නිදහස් නිවහල් භූමියේ අනාගත

හිමිකරුවන් වන දරුවන්ට එකී උරුමය භාරගෙන විරිය සහිතව අභියෝග ජයගෙන අභිමානයෙන් කටයුතු කරන දරු පරපුරක් ලෙස ක්‍රියාකිරීමට ඉඩ සැලැස්විය යුතු බව සඳහන් කර ඇත. (ම. චි. ඉ. දැ. පිටුව 22)

08. අරමුදලේ ක්‍රියාකාරිත්වය

මෙය රාජ්‍ය අරමුදලකි. අරමුදල අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත කර්තව්‍ය ඉටු කිරීම සඳහා වැය කරන අතර, අවශ්‍ය අවස්ථාවන්හි දී විෂය භාර ගරු අමාත්‍ය වරයාගේ ලිඛිත අවසරය ද ලබා ගැනීම සිදු කෙරේ. ආණ්ඩුවේ ළමා රැකවරණයට අදාළ ප්‍රතිපත්තියට අනුකූලව හා ළමා විෂයභාර රේඛීය අමාත්‍යවරයාගේ පොදු හා විශේෂ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමේ වගකීම දරයි. මේ සඳහා වෙනත් කාර්ය මණ්ඩල පත් නොකරන අතර අධිකාරියේ අදාළ වන්නාවූ නිලධාරීන් සඳහා කිසියම් රජයේ අනුමත මූල්‍ය ප්‍රතිපාදනයක් රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් ලබා දේ. එය පනතේ 12 වැනි වගන්තිය තුළ පැහැදිලිව දක්වා තිබීම හා අරමුදලේ ක්‍රියාකාරිත්වය විධිමත්ව නීතිගතව තිබීම අරමුදල් යෙදවීමේ ක්‍රමවේදය ශක්තිමත් පදනමක් මත සමාජගත වීම තහවුරු කර ඇත.

09. අරමුදල පරිපාලනයේ ව්‍යූහය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති හා නියෝජ්‍ය සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම හා වගවීම යටතේ මධ්‍යම රජයෙන් ලැබෙන අරමුදල් පරිපාලනය කරන ලෙසටම සියලු පරිපාලන කටයුතු සිදු වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයන් අතිගරු ජනාධිපතිතුමා විසින් සභාපති හා උප සභාපති පත් කරන ආකාරයටම විධිමත්ව පත් කෙරේ.

10. අරමුදලේ ගිණුම් පවත්වා ගැනීම හා විගණනය

ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ 22 වැනි වගන්තිය පරිදි මුදල් වර්ෂය ලිත් වර්ෂය වන අතර රාජ්‍ය සංස්ථාවල ගිණුම් පවත්වා ගැනීම හා විගණනය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තියේ අන්තර්ගත විධිවිධාන අදාළ වෙයි. ඒ මත පදනම්ව වෙනමම ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. ඒ සමගම මහා භාණ්ඩාගාරය, පාර්ලිමේන්තුව, විගණකාධිපති දෙපාර්තමේන්තුව වැනි ආයතන වෙත ද අවශ්‍ය අවස්ථාවවල දී වාර්තා කිරීම සිදු කෙරේ.

11. අරමුදලේ ආරක්ෂාව

අධිකාරිය යටතේ වන රාජ්‍ය අරමුදලක් වීම හේතුවෙන් ද, විශේෂයෙන් අධිකාරිය අල්ලස් හා දූෂණ පනතේ උපලේඛනගත රාජ්‍ය ආයතනයක් වීමෙන් ද, සියලු සාමාජිකයින්, නිලධරයින්, සේවකයින් සඳහා එය වලංගු වේ. අරමුදලේ ගිණුම "ජාතික ළමා ආරක්ෂක අරමුදල" නමින් රාජ්‍ය බැංකුවක් වූ ලංකා බැංකුව නුගේගොඩ ප්‍රධාන ශාඛාවේ (ගිණුම් අංක 71252941) ආරම්භ කර ඇත.

12. අරමුදලේ පැවැත්ම හා සංවර්ධනයේ තහවුරුව

මෙය ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ වන 01 සිට 40 දක්වා වූ සියලුම විධිවිධාන බල පැවැත්වෙන පරිදි පනත මගින් එහි පැවැත්ම තහවුරු කොට ඇත. එමෙන්ම පනතේ ප්‍රකාර ඉදිරියේ අධිකාරියේ කර්තව්‍ය සංවර්ධනාත්මකව ජාතික ළමා පරපුරේ ප්‍රගතිය උදෙසා සහ ළමා ආරක්ෂාව උදෙසා කෙරෙන සියලුම දේ සමගින් සම්බන්ධීකරණය කෙරේ. ඉදිරියේ දී එකී ළමා ආරක්ෂක අධිකාරිය මෙරට තුළ ස්වාධීනත්වය තහවුරුව පැවැත්ම මත ළමා පරපුර රැක ගැනීම හා සුභ සිද්ධිය සඳහා සිදුවිය හැකි සියලු ළමා අපචාර, අපයෝජන වළක්වාලීමට කටයුතු කරයි. එම ක්‍රියාවලිය සඳහා මෙරට හා විදේශගතව ඇති ආයතන හා පුද්ගල වැනි අප රටට ආදරය කරන ජන කණ්ඩායම් තුළින් හා ව්‍යාපාරික ප්‍රජාව තුළින් ලබා ගන්නා අරමුදල් තැන්පත් කොට පරිහරණය කර විනිවිද භාවයකින් යුතුව සංවර්ධනය කිරීම අධිකාරිය සිදු කරයි.

කමනි ගුණසේකර,
ලේකම්,
ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය.

2011 ජනවාරි මස 07 වැනි දින,

02-135

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.11.24 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් ඒ. ගාල්ලගේ මහතා විසින් සහතික කරන ලද 2007.06.18 වැනි දිනැති අංක 750 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2010.09.27 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් දෙලක්ෂ දහනව දහස් දෙසිය අසූහයයි ශත අනූපහක (රු. 2,19,286.95) මුදලක් සමග රුපියල් දෙලක්ෂ තුන්දහස් හාරසිය දාසයයි ශත විසිනවයක (රු. 2,03,416.29) මුදලක් මත වසරකට සියයට දොළහයි දශම අටයි පහ (12.85%) බැගින් පොළියක් ද, 2010.09.28 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පොළොන්නරුව, වැවේතැන්න, අංක 35/2 හි පදිංචි පතිරණගේ දොන් සුසිල් අබේවික්‍රම මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 750 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් දෙලක්ෂ දහනව දහස් දෙසිය අසූහයයි ශත අනූපහක (රු. 2,19,286.95) මුදල සමග 2010.09.27 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ ද මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, සේවාගම ශාඛාවේ, කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ලංකාපුර (මැතකදී තමන්කඩුව ලෙස) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 73E ලක්ෂ උයන ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසයේ, සේවාමුක්ත ජනපදයේ පිහිටි "වැවේතැන්න" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. පියදාස විසින් සාදන ලද 2005.10.27 වැනි දිනැති අංක 169/09/2005 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දක්වා නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල, උතුරට : F. C. P.Po. 13 හි ලොට් 25 ද, නැගෙනහිරට : ලොට් 25, 8 (පාර) සහ F. C. P. Po. 13 හි ලොට් 32 හි කොටසක් ද, දකුණට : F. C. P. Po. 13හි ලොට් 33 ද, බස්නාහිරට : F. C. P. Po. 13හි ලොට් 5 (ජලාපවහන මාර්ගය) ද, මායිම්වන අක්කර එකයි රූඩ් තුනයි පර්චස් අටක (අ. 1, රූ. 3, පර්. 8) බිම් ප්‍රමාණයකින් යුක්ත වූ ඉඩම සමග ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි ඇතුළු එහි ඇති සියලු දේද වේ. මෙය පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L. D. O. 3/5/3/178හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. එම්. ඉස්මි මහතා,
කළමනාකරු.

ලංකා බැංකුව,
සේවාගම.

02-104

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2011** | | | |
| පෙබරවාරි | 2011.02.03 | බ්‍රහස්පතින්දා | 2011.01.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.02.11 | සිකුරාදා | 2011.01.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.02.18 | සිකුරාදා | 2011.02.03 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2011.02.25 | සිකුරාදා | 2011.02.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2011.03.04 | සිකුරාදා | 2011.02.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.03.11 | සිකුරාදා | 2011.02.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.03.18 | සිකුරාදා | 2011.03.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.03.25 | සිකුරාදා | 2011.03.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2011.04.01 | සිකුරාදා | 2011.03.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.04.08 | සිකුරාදා | 2011.03.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.04.15 | සිකුරාදා | 2011.04.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.04.21 | බ්‍රහස්පතින්දා | 2011.04.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.04.29 | සිකුරාදා | 2011.04.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.